සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/08/01/චක්‍ර
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2024.07.22

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2024/05**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත,**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු ස්වශක්ති ණය වැඩසටහන ක්‍රියාත්මක කිරිම</u>**
**<u>අනිවාර්ය ඉතිරි තැන්පතු ශේෂය ඇපය මත ස්වශක්ති ණය මුදල් ලබාදීම</u>**

**1. හැදින්වීම.**

සමෘද්ධි බැංකු විසින්, සාමාජික, සාමාජික නොවන, දිරියමාතා සහ ස්ථාවර තැන්පතු ගිණුම්වල පවතින ශේෂය ඇපය මත (තැන්පතුවට එරෙහිව ණය)ණය මුදල් නිකුත් කිරීමට ස්වශක්ති ණය වැඩසටහන හඳුන්වා දී ඇත.

සමෘද්ධි සහනාධාර වැඩසටහන අත්හිටුවීමත් සමඟ අනිවාර්ය ඉතිරි තැන්පතු මුදල් ආපසු ලබාගැනීමට ගණුදෙනුකරුවන් විශාල වශයෙන් ඉදිරිපත් වේ.

එමගින් ,අනිවාර්ය ඉතිරි තැන්පතු මුදල් ආපසු ලබාදීමෙන් සමෘද්ධි බැංකුවල ද්‍රවශීලතාවයට බලපෑමක් ඇතිවන වන අතර, ගිණුම් හිමියන්ව ද අපහසුතාවයන්ට පත්වීම වලක්වා ගැනීම සඳහා අනිවාර්ය ඉතිරි තැන්පතු ශේෂය සුරැකුමක් ලෙස තබාගෙන ස්වශක්ති ණය මුදලක් ලබාදීමට තීරණය කර ඇත.

මේ සම්බන්ධව, උපදෙස් හා ණය ලබාදීමේ ක්‍රියාවලිය පිළිබඳව සමෘද්ධි බැංකු කාර්යය මංඩලය දැනුවත් කිරීමට මෙම චක්‍ර ලේඛ උපදෙස් නිකුත් කරන බව දන්වමි.

**2. ණය ලබාදෙන කාරණාවන් හා උපරිම ණය මුදල**

**2.1**

| ණය ලබාදෙන කාරණාව | උපරිම ණය මුදල රු. |
|---|---|
| ස්වයං රැකියා/ කෘෂිකාර්මික වගාවන් සඳහා | තැන්පතු මුදලින් 90% දක්වා |
| දරුවන්ගේ උසස්/ වෘත්තිය අධ්‍යාපනය සඳහා (දේශිය/විදේශිය) | තැන්පතු මුදලින් 90% දක්වා උපරිම ණය මුදල රු. 100,000/- කි. |
| පාරිභෝගික / ආපදා සඳහා | උපරිම ණය මුදල රු. 50,000/- කි. |

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramu

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General — Tel- 011-2872202, Fax - 011-2889002, E-mail- dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) — 011-2873799, 011-2873996, diradmin@samurdhi.gov.lk, Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant — 011-2869742, 011-2869742, finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) — 011-2889003, 011-2887469, Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office — 0112872202, Hot Line: 011- 288

ඉහත සඳහන් කාරණාවන් සඳහා ණය මුදල් ලබාදීමේදී, ණය මුදල ඉල්ලුම් කරන දිනට පවතින තැන්පතු ශේෂයෙන් 90% හෝ උපරිම ණය මුදල යන අගයන් වලින් අඩුම අගයට මත ණය මුදල තීර්ණය කලයුතුය.

2.2 ස්වයංරැකියා / කෘෂිකාර්මික වැනි ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් ණය මුදලක් ලබාදීමේදී, ණය මුදල යොදවන කාරණාව හා අපේක්ෂිත ආදායම පිළිබඳ ව්‍යාපෘති වාර්තාවක් ලබාගෙන ණය මුදල නිකුත් කල යුතුය. ඒ සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරින් ණයකරුට සහාය දැක්විය යුතුය. ණය මුදල යොදවන ව්‍යාපෘතිය පවත්වාගෙන යන ව්‍යාපෘතිකරු ගිණුම් හිමියා/ කලත්‍රයා/ අවිවාහක දරුවෙක් විය යුතුය.

2.3 පළමු ගිණුම්කරුගේ පවුලේ අවිවාහක දරුවන්ගේ උසස් අධ්‍යාපනය/ වෘත්තිය පුහුණුව සඳහා වැය වන පාඨමාලා ගාස්තු , පරිගණක උපකරණ මිලට ගැනීම ඇතුළු අනිකුත් වියදම් වෙනුවෙන් ද මෙම ණය වැඩසටහන යටතේ මුදල් ලබාදිය හැක.

2.4 පාරිභෝගික / ආපදා වැනි කාරණාවන් වෙනුවෙන් ණය මුදලක් මුදා හැරීමේදී, අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුමේ පළමු ගිණුම්කරුගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් පමණක් ණය නිකුත් කල යුතුය.

2.5 ණයකරුවෙකු ලබාගත් ණය මුදලක් ගිවිසුමට අනුව ගෙවා අවසන් වූ පසු, තව ණය මුදලක් ඉල්ලුම් කිරීමට ඉඩ දෙනු ලැබේ.

**3. වාර්ෂික පොලි අනුපාතය (%) හා ආපසු ගෙවීම් කාලය (මාස).**

3.1 වාර්ෂික පොලි අනුපාතය, අනිවාර්ය ඉතිරිකිරීම් ගිණුමට ලබාදෙන වාර්ෂික පොළී අනුපාතයට 2% එකතු කර ලැබෙන අගය වේ.(හීන වන ශේෂ ක්‍රමයට)

3.2 ආපසු ගෙවීම් කාලය

| මුදල රු. | ආපසු ගෙවීම් කාලය (මාස) |
|---|---|
| 10,000 හෝ ඊට අඩු නම් | 12 |
| 10,001 – 25,000 | 24 |
| 25,001 – 50,000 | 36 |
| 50,001 හෝ ඊට වැඩි | 48 |

3.3 උපරිම ආපසු ගෙවීම් කාලයක් හඳුන්වා දී තිබුන ද, ණයකරුගේ කැමැත්ත අනුව උපරිම කාලයට වඩා අඩු කාලයක් තුල ණය මුදල ආපසු ගෙවීමට ඉඩ දෙනු ලැබේ.

3.4 යම් අවස්ථාවක, පිටහිටි ණය මුදල හා එදිනට ගෙවිය යුතු පොලි මුදල එකවරම ගෙවා ණය මුදලින් නිදහස් විය හැක.

3.5 සමෘද්ධි බැංකු ණය වැඩසටහනින් ණය මුදලක් ගෙවා යන ණයකරුවෙකුට වුව ද, මෙම ණය මුදලක් ඉල්ලුම් කල හැක. දැනට බොල් ණය / ණය පැහැර හැරි ණය මුදලක් ඇති අයෙකුට මෙම ණය වැඩසටහන යටතේ ණය නිකුත් කල නොහැක.

3.6 දැනට නිකුත් කර ඇති චක්‍ර ලේඛ උපදෙස් මත, අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු මුදල් ආපසු ඉල්ලා සිටින විටක මෙම ණය වැඩසටහන යටතේ ලබාගත් ණය මුදල ආපසු ගෙවා අවසන් වී තිබිම අනිවාර්ය වේ.

මෙවැනි අවස්ථාවක,ණය කරුට ණය මුදල ආපසු ගෙවිමට නොහැකි තත්වයක සිටිනම් දැනට ඇති පිටහිටි ණය මුදලට අමතරව, පිටහිටි ණය මුදලින් 20% ක්ද ගිණුමේ රඳවා ගෙන ඉතිරි මුදල නිදහස් හැක.

උදා: පිටහිටි ණය මුදල රු.90,000 ක් නම්, රු.108,000 ක් අනිවාර්ය ඉතිරිකිරීම් ගිණුමේ රඳවා ගැනිම අනිවාර්ය වේ.

**4.** ඇප සුරකුම්

4.1 අනිවාර්ය ඉතිරි කිරිමේ ගිණුමේ පවතින ශේෂය.

4.2 ණය මුදල ගෙවා අවසන් වනතුරු තැන්පතු මුදල HOLD කර තැබිය යුතුය.

**5. ණය මුදල ඉල්ලුම් කිරීම හා භාවිතා කල යුතු ලියවිලි.**

5.1 ණය මුදල ඉල්ලුම් කිරිම.

I. පළමු ගිණුම් හිමියා විසින් ණය මුදල ඉල්ලුම් කල යුතුය.
II. බද්ධ ගිණුම් හිමියා , ණය ඉල්ලුම් පත්‍රය අත්සන කර කැමැත්ත ප්‍රකාශ කල යුතුය.
II. බද්ධ ගිණුම් හිමියාගේ අකැමැත්ත ප්‍රකාශ කරන විටක, ණය මුදල නොදිය යුතුය.
III. ණය මුදලක් වෙනුවට අනිවාර්ය ඉතිරි ගිණුමේ ශේෂය ඇපයට තබා තිබීම හෝ අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම්හිමියා ලෙස වෙනත් ණය මුදලකට ඇපයට අත්සන් කර, එම ණය මුදල පැහැර හැර තිබෙන විටෙක මෙම ණය මුදල නිකුත් නොකල යුතුය.

5.2 ණය ඉල්ලුම් කිරීමට ඇමුණුම - 01 ණය ඉල්ලුම් පත්‍රය හා ගිවිසුම භාවිතා කල යුතුය.

**6. ණය අනුමත කිරීම, මුදාහැරීම හා අයකර ගැනීම.**

6.1 ණය මුදල අනුමත කිරීම පාලක මණ්ඩලය විසින් කල යුතු අතර, ආවරණ අනුමැතියට යටත්ව ද කළමනාකරු ණය මුදල නිදහස් කළ හැක.

6.2 ණය මුදල් මුදාහැරීම.

| | |
|---|---|
| ලැබිය යුතු ණය ගිණුම - ස්වශක්ති | - හර |
| සාමාජික තැන්පත්/ දිරියමාතා/සමාජික නොවන තැන්පතු ගිණුම | - බැර |

ගිණුම්හිමියාගේ හෝ බද්ධ ගිණුම් හිමියා නමින් ඇති ගිණුමකට ද මාරු කළ යුතුය. බද්ධ ණයකරුගේ ඉතිරි කිරීම් ගිණුමට මාරු කරන විටක පළමු ගිණුම් හිමියා කැමැත්ත ලිඛිතව ලබා දිය යුතුය.

6.3 ණය අයකර ගැනීම.

| | |
|---|---|
| සාමාජික තැන්පත්/ දිරියමාතා ගිණුම/ සාමාජික නොවන තැන්පතු ගිණුම | - හර |
| ලද පොලිය - දුන් ණය ගිණුම | - බැර |
| ලැබිය යුතු ණය ගිණුම - ස්වශක්ති | - බැර |

6.4 පරිගණක මෘදුකාංගය හරහා ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට, දී ඇති ක්‍රමවේදයක් භාවිතා කර, තොරතුරු/ දත්ත ඇතුලත් කල යුතුය.

6.5 අඛණ්ඩ මාස 03 ක්, ණය වාරික හා පොලී මුදල් නොගෙවන විටක අනිවාර්ය තැන්පතු මුදලින් පිටහිටි ණය මුදල හිලව් කර ගත යුතුය.

**7.** සමුහ හා ණය සංරක්ෂණ වැඩසටහන් සඳහා දායකවීම අදාල නොවේ.

**8.** වෙනත් කරුණු

**8.1** ආදායම් උත්පාදන කාර්යයකට ණය මුදල ඉල්ලුම් කරන විටක දැනටමත් ක්‍රියාත්මක හෝ අළුතින් ආරම්භ කරන ව්‍යාපෘතියක් විය හැක. එමෙන්ම ඵලදායි ව්‍යාපෘතියක් විම අනිවාර්ය වේ.

**8.2** වයස්ගත හා අසාධ්‍ය රෝගී තත්ත්වයක සිටින අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම්හිමියන් තැන්පත් මුදල් ඉල්ලා සිටින විටක ඒ වෙනුවට ණය මුදල් ලබාගැනිමට බල නොකල යුතුය.

9. මේ සම්බන්ධව තවදුරටත් අවශ්‍ය උපදෙස් සඳහා ස්වශක්ති ණය වැඩසටහනට අදාලව නිකුත් කල චක්‍ර ලේඛ උපදෙස් වලංගුවේ.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ගැ.ස.